සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilization & National Policies
ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො.191, ධර්මපාල මාවත, කොළඹ 07 | ஜே ஆர் ஜெயவர்தன மையம், 191, தர்மபால மாவத்தை, கொழும்பு 7
J.R. Jayewardene Center, No.191, Dharmapala Mawatha, Colombo 07

| | | | | | |
|---|---|---|---|---|---|
| මාගේ අංකය<br>எனது இல<br>My No. | WBB/Notice/D/Div/2024 | ඔබගේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2024.4. 24 |

WBB/Circular/No10/2024

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් /

නියෝජ්‍ය සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් වෙත,

**<u>අස්වැසුම වැඩසටහනට තේරී ඇති නමුත් ජාතික හැඳුනුම්පතක් මෙතෙක් ලබාගෙන නොමැති තැනැත්තන් හා ජාතික හැඳුනුම්පත් නොමැති වීම නිසා අස්වැසුම වැඩසටහන සඳහා ඇතුලත්වීමට නොහැකි තැනැත්තන්ගේ ගැටළුව සඳහා විසඳුම් ලබාදීම</u>.**

අස්වැසුම සුභසාධක ප්‍රතිලාභීන් තෝරාගැනීම සඳහා දෙවන අදියරේ අයදුම්පත් කැඳවීමේදී ජාතික හැඳුනුම්පත් නොමැති පුද්ගලයින්ට අයදුම් කිරීමට අවස්ථාව ලබා දී නොමැත.මෙම වැඩසටහන යටතේ අයදුම්කිරීමට අපේක්ෂාවෙන් සිටියද ජාතික හැඳුනුම්පතක් නොමැති වීම හේතුවෙන් අයදුම්කිරීමට නොහැකි වූ තැනැත්තන් හඳුනාගෙන ඔවුන්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කරවීම සඳහා විශේෂ වැඩපිළිවෙළක් යෙදීමත් ඒ තුළින් මෙම වැඩසටහන සඳහා ඉදිරියේදී ඇතුලත් කරගැනීමත් අවශ්‍ය වේ. එමෙන්ම දැනටමත් අස්වැසුම වැඩසටහනට අයදුම්කර ප්‍රතිලාභ හිමිව ඇතත් ජාතික හැඳුනුම්පතක් නොමැති තැනැත්තන්ද සිටී. එබැවින් එවැනි තැනැත්තන් හඳුනාගැනීම හා ඔවුන්ට ජාතික හැඳුනුම්පත් කඩිනමින් නිකුත් කිරීම සඳහා පහත සඳහන් විශේෂ වැඩපිළිවෙල ක්‍රියාත්මක කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

ජාතික හැඳුනුම්පත් නොමැති පුද්ගලයින් හඳුනා ගැනීම :-

දෙවන අදියරේ අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහන යටතේ අයදුම්පත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට භාර ගැනීමේදී ජාතික හැඳුනුම්පත් නොමැති හේතුව මත IWMS පද්ධතියට ඇතුල් කිරීමට නොහැකි වූ අයදුම්පත් වෙනම ගොනුකර තබාගන්නා ලෙස මාගේ අංක WBB/Circular/No08/2024 දරණ 2024.03.26 දිනැති චක්‍රලේඛය මඟින් උපදෙස් දී තිබුණි. එසේ වෙන්කර තබාගෙන ඇති අයදුම්පත්වල තොරතුරු මඟින් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීමට අවශ්‍ය පුද්ගලයින් හඳුනාගත හැක. එම පුද්ගලයින්ගේ ලේඛනයක් සකස් කර ගන්න.

ඊට අමතරව ජාතික හැඳුනුම්පත් නොමැති එහෙත් රජයේ සහනාධාර අපේක්ෂා කරන පුද්ගලයින්ගේ ලේඛනයක් ග්‍රාම නිලධාරීන් මඟින් ලබා ගන්න.

අස්වැසුම වැඩසටහනට ඇතුලත් ජාතික හැඳුනුම්පත් නොමැති පුද්ගලයින්ගේ ලැයිස්තු දැනටමත් ඔබ වෙත යොමු කර ඇත.

ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම :-

ඉහත සඳහන් පරිදි හඳුනාගන්නා ලද පුද්ගලයින්ගේ ලේඛනය අනුව එම පුද්ගලයින්ට ජාතික හැඳුනුම්පත් ලබාගැනීමට අවශ්‍ය අයදුම්පත් ආකෘතිපත් ග්‍රාම නිලධාරී මඟින් ලබා දී ඒවා සම්පූර්ණ කරවාගෙන අදාළ ලියකියවිලිද සමඟ ලබාගෙන සහතික කර යැවීම සඳහා විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න. මෙහිදී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ උපදෙස් උපයෝගී කර ගන්නා මෙන් දන්වමි.

Scanned with CamScanner

මෙහිදී ආබාධිත හෝ වයෝවෘධභාවය නිසා හෝ අසනීප තත්ත්වයන් නිසා නිවසින් බැහැර වීමට අපහසු පුද්ගලයින් සම්බන්ධයෙන් නිවෙස්වලට ගොස් ලියකියවිලි සම්පූර්ණ කර ගැනීමේ වැඩපිළිවෙළක් යොදන්න. ඒ සඳහා වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධන නිලධාරී, සමාජ සේවා නිලධාරී වැනි ක්ෂේත්‍ර නිලධාරීන්ගේ සහාය ලබාගන්න. එවැනි පුද්ගලයින්ගේ ඡායාරූප ලබාගැනීම සඳහා ප්‍රදේශයේ බලයලත් ඡායාරූප ශාලාවලින් ඡායාරූප ශිල්පීන් නිවෙස්වලට කැඳවා ඡායාරූප ලබාගැනීමේ විශේෂ වැඩපිළිවෙලක් ද යොදන ලෙස දන්වමි. ඒ සඳහා අවශ්‍ය නම් ප්‍රවාහන පහසුකම් සපයන මෙන්ද ඒ සඳහා අවශ්‍ය ඉන්ධන සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කරන මෙන්ද දන්වමි.

මේ අනුව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව වෙත අයදුම්පත් යැවීමේදී අස්වැසුම වැඩසටහන යටතේ ප්‍රමුඛතාවය ලබාදෙන ලෙස ඉල්ලමින් ආවරණ ලිපියක් අයදුම්කරුවන්ගේ නම් ලැයිස්තුවද සමඟ යවන ලෙසත්, එහි පිටපතක් මා වෙත එවන ලෙසත් වැඩිදුරටත් දන්වමි. එම පිටපත අනුව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් සමඟ සම්බන්ධීකරණය කරමින් එම හැඳුනුම්පත් කඩිනමින් නිකුත් කරවීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබේ.

මෙසේ ජාතික හැඳුනුම්පත් අවශ්‍ය පුද්ගලයින්ට හැඳුනුම්පත් නිකුත් කිරීම තුළින් අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ වැඩසටහනට ඉදිරියේදී එම අවශ්‍යතා ඇති පුද්ගලයින් ඇතුලත් කර ගැනීමට අපේක්ෂිත බව කාරුණිකව සලකන්න. එබැවින් මෙම ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ වැඩපිළිවෙළ විශේෂ අවශ්‍යතාවයක් සේ සලකා ඉහළ ප්‍රමුඛතාවයත් ලබා දී ක්‍රියාත්මක කරන මෙන් කාරුණිකව දන්වමි.

ජයන්ත විජේරත්න

සභාපති/ කොමසාරිස්

පිටපත් : පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් - අ.ක.ස

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ අතිරේක සුභසාධක ප්‍රතිලාභ කොමසාරිස්වරුන් - කා.දැ.පි

Scanned with CamScanner